# ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමා කලාවෙහි හස්ත මුද්‍ර භාවිතය පිළිබඳ විමර්ශනයක්

**තුෂාණි සංදීපනී මාටින්**

## Abstract

බුදු පිළිමයේ ආරම්භය බුද්ධ පරිනිර්වාණයෙන් පසුව සිදු වූ බව සිතිය හැකිය. අනාදිමත් කාලයක සිට ලංකාවේ මූර්ති කලාව පිළිබඳ තොරතුරු පුරාවස්තු සහ ඓතිහාසික සාධක තුළින් හමුවේ. මෙහිලා කලාව තුළ විවිධ ඉසව් රැසක්ම අන්තර්ගතවන අතර එහි එක් පැතිකඩක් ලෙස මූර්ති කලාව හැඳින්වේ. ඒ අනුව ලාංකේය බුද්ධ ප්‍රතිමා කලාවෙහි මුද්‍රා භාවිතය පිළිබඳව ඉතිහාසය තුළින් විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම වැදගත්ය. මෙම පර්යේෂණයේ ගැටළුව වන්නේ ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමා කලාවෙහි භාවිත කරනු ලබන හස්ත මුද්‍රාවන්හි ඓතිහාසික ස්වරූපය වර්තමානයේ ද එලෙසින්ම පවතින්නේ දැයි විමසීමය. මෙම පර්යේෂණයේ මූලික කොටස් දෙකකි. පළමුවැන්න ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ අන්තර්ගතවන පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදයයි. එහිදී පොත්පත්, ලිපි ලේඛන මෙන්ම ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් පෞරාණික හා කාලීන ලේඛන ද අධ්‍යයන කළේය. දෙවැන්න ක්ෂේත්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ තෝරාගත් ඉලක්කගත ශිල්පීන්ගේ සහභාගීත්වයෙන්, සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමවේදය යටතේ කරුණු එක්තැන් කළේය. ඒ අනුව එකිනෙකට වෙනස් බුද්ධ ප්‍රතිමා කලාවෙහි භාවිත හස්ත මුද්‍රා කිහිපයක් පිළිබඳව මූලිකව හඳුනා ගැනුනි. මෙහිදී විචාරකයන්ගේ පිළිගැනීම අනුව මුද්‍රා දහතුනක් හා සම්මතයෙහි දහයක් ඇත. ඒ අතර **අභය මුද්‍රාව, ධන්‍ය මුද්‍රාව, වරද මුද්‍රාව, ධර්මචක්‍ර මුද්‍රාව, ශුචි හස්ත මුද්‍රාව, භූමි ස්පර්ශ මුද්‍රාව, විතර්ක හස්ත මුද්‍රාව, සමාධි මුද්‍රාව** ආදී විවිධ මුද්‍රා වීය. සමස්තයක් වශයෙන් බුද්ධ ප්‍රතිමා නිර්මාණකරුවෝ මෙම හස්ත මුද්‍රාවන් විවිධාකාරයෙන් උපයෝගී කරගත්හ. ඒ අනුව විවිධ වෙනස්කම්වලට ලක්වෙමින් වුවද ලාංකේය බුද්ධ ප්‍රතිමා කලාවෙහි භාවිත හස්ත මුද්‍රාවන් ඒ ශිල්පීන්ගේ හසුරු කුසලතාවය මත වර්තමානයේ ද තරමක් දුරට පැවතේ. එබැවින් ඓතිහාසික මෙන්ම කාලීන වටිනාකමක් සහිත වූ මෙම අග්‍රගණ්‍ය බුද්ධ ප්‍රතිමා නිර්මාණ කලාවෙහි නිරත ශිල්පීන් හස්ත මුද්‍රාවන් තවදුරටත් ආරක්ෂා කරගැනීම අනිවාර්ය කාර්යක් බව යෝජනාවක් ලෙස ඉදිරිපත් කළ හැකිය. ඒ අනුව ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමා කලාවෙහි හස්ත මුද්‍ර භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනය මෙසේ පෙන්වා දිය හැකිය.

**ප්‍රමුඛ පද**

ඓතිහාසික ස්වරූපය, දේශීය අනන්‍යතාවය, බුද්ධ ප්‍රතිමා, මූර්ති කලාව, හස්ත මුද්‍රා

## හැඳින්වීම

මුද්‍රා භාවිතය මගින් විවිධ අදහස් උදහස් ප්‍රකට කෙරේ. ජාතීන් අතර මුද්‍රා භාවිතයේ වෙනස්කම් දිස්වේ. භෞමික පරිසරය හා දේශගුණික පරිසරය මෙන් ම වෙනස් වූ සංස්කෘතීන් යටතේ ද එහි විවිධත්ව රාශියක් ඇති බව පෙනේ. සංකේතාත්මකව අදහස් පැවසීම මුද්‍රා මගින් කෙරෙන්නෙකි. කායික අංග ප්‍රත්‍යාංගයන්හි ආධාරයෙන් සකස් කොට ගන්නා රූප සටහන් බොහෝමයක් **"කථන මුද්‍රා"** නමින් හැඳින්වේ. බුද්ධ ප්‍රතිමාවක දක්නට ලැබෙන මුලික අංග අතර මුද්‍රාවට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. අදහස් ප්‍රකාශනයට වචන භාවිත නොවන කල්හී අංග චලනය ප්‍රකාශන මාධ්‍යයක් වශයෙන් යොදා ගැනුණි. මේවා මුද්‍රා හෙවත් **"හස්ත"** නමින් හඳුන්වනු ලැබේ. **"අදහස් ඇගයීමට අතේ ඇඟිලි ආදිය උපයෝගී කරගෙන විවිධාකාර අර්ථ ප්‍රකාශ කිරීමකි. ඇඟිලි ප්‍රයෝග යෙදීම ඉන්දීය නර්තනයට විශේෂ වේ. එමගින් ඔවුන් ඉදිරිපත් කරන රංගනයට අර්ථයක් දීමට උත්සාහ දරයි. දේශීය රංගනයේ දී ද මුද්‍රා භාවිතයට ගැනේ".**[1]

හස්ත මුද්‍රා යන වචනය යෙදෙන අවස්ථා වල දී, එයින් පිළිබිඹු වන අර්ථයේ ස්වරූපය ද වෙනස් වේ. එය **"අතින් සංඥා කොට අදහස් ඇඟවීම, අතේ ඇඟිලි විදහා පෑම"** ආදිය ද යොදා ගනිමින් කරනු ලබන භාව ප්‍රකාශනයන් වේ. එසේම බුදුන්, බෝසත්, දෙවියන් වැනි අධිමානුෂීය තත්ත්වයකින් යුක්ත වූවන් ඇඟිලි එක්කර පිහිටුවා ගැනීමෙන් හඟවන චිත්‍ර රූපය අතේ ඇඟිලි වලින් ගණන් දැක්වීමේ ශිල්ප ක්‍රමය ද වේ. මෙම වලංගුභාවය ප්‍රකාශ කිරීම සඳහා යොදාගනු ලබන ඇඟිලි සලකුණු යනාදිය හස්ත මුද්‍රා භාවිත කරමින් කළ හැකි සන්නිවේදන කාර්යයක් ලෙස ද සැලකේ. මුද්‍රා යනු විවිධ අර්ථවල යෙදෙන වචනයකි. "**සන්නස, පුවරුව, වලංගු බව, හඟවන ලකුණ, ලාංඡනය, සංඥාව"** ආදී අර්ථ රාශියක් සංස්කෘත ශබ්දකෝෂවල ඉදිරිපත් වේ. පාලියෙහි **"මුද්ද"** යනුවෙන් මෙම වචනය භාවිත වේ.

[1] ලලිත කලා සාර සංග්‍රහය, පළමුවැනි වෙළුම, දෙවෙනි කලාපය, 142 පිටුව

**"රාජ මුද්දා"** යන්න **"රාජකීය ලාංඡනය"** හෙවත් **"රාජ්‍ය මුද්‍රාව"** අදහස් කෙරේ. **"හත්‍ථි මුද්දා"** යනුවෙන් යෙදී ඇති තැන්වල අර්ථ දෙකක් හැඳින්විය හැකිය. එනම්, **"වලංගුභාවය දක්වන ඇඟිලි සලකුණු"** හා **"අත් වලින් හඟවන සංඥාව** හෙවත් **"සන්නිවේදනය"** වේ.[2]

දියුණු සංස්කෘතීන්හි ප්‍රචලිත **"වැ ආ,"** එනම්, **එය නොකියා, නොලියා අදහස් ප්‍රකට කිරීම** සඳහා ව්‍යක්ත කලා මාධ්‍යය සැලකිය හැකිය. මෙය බොහෝවිට රාජ්‍යයත්වය හැඟවීම සඳහා ද භාවිතා කොට ඇත. ඒ හැරෙන විට මුද්‍රා සංකේත දක්විය හැක්කේ, බුදුවරුන්, බෝසත්වරුන් හා දෙවිවරුන්ගේ රූපවලට සම්බන්ධ කොට ගෙනයි. මුද්‍රාවල ආරම්භය, ඒවායේ හැඩය, ඒවායින් පැවසෙන අදහස් ආදිය විවිධ විය. ඒ සියල්ලේහි අරුත් කැටි කොට ගන්නා විට රාජ්‍යය පාලකවරුන්ගේ රාජකීය බව හඟවන රූ සටහනට මුද්‍රා යන නම යොදා ඇත. බොහෝ සෙයින් මේ අදහස් සඳහා යොදාගෙන ඇත්තේ **"හංස"** ලාංඡනයයි. පාරිශුද්ධියක්, යුක්තිය හා අයුක්තිය, විනිශ්චයන් එයින් සංකේතවත් වෙතැයි පිළිගත හැකිය. ධර්මාශෝක රජතුමාගේ රාජ මුද්‍රාව ඔහුගේ දත් ඇන්ද තුළ රඳවා ගෙන තබා ගත් බවත් කුණාලකුමාර කතාවෙන් පැවසෙයි.

මුද්‍රාවල දී මූලිකත්වය ලැබෙන්නේ අත් සහ ඇඟිලිවලින් දක්වෙන අභිනයන්ට නිසා ශිල්ප ශාස්ත්‍රයෙහි දී මුද්‍රා වෙනුවට **"හස්ත "** යන වචනය ද භාවිත වී ඇත. ඇඟිල්ලෙහි ලඟ මුද්ද ද මුද්‍රා නමින් ගෙන ඇත. ඇඟිලිවල යම් සංඥා හෝ ලකුණු තබා ගණන් සඳහා වූ ශිල්ප ක්‍රමයන් එයින් කියැවේ. මුද්‍රා භාවිතයෙහි පෞරාණිකත්වය ගැන සලකනවිට පුරාතන ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් ලැබී ඇති සාධක වැදගත් වේ. අදහස් ප්‍රකාශනයේ දී යොදා ගැනුණු මුද්‍රා භාෂාවන් අතීතයේ පටන් අපට උරුම ව තිබූ බවට තොරතුරු ලැබේ. මහා බෝසතුන් මහෞෂධ නම් අමාත්‍ය පණ්ඩිතයෙකුව උපන් ජාතියෙහි ගෙවූ ජීවිතය පිළිබඳව කරන විස්තරයක හස්ත මුද්‍රා භාවිත කරමින් පැන විමසූ ආකාරය විස්තර කොට ඇත. ඒ පිළිබඳව උම්මග්ග ජාතකයෙහි **"ජන්නපථ ස්ත්‍රී පැනයෙහි"** දක්වෙනු ඇත. මෙහි අමරා කුමරිය හස්ත මුද්‍රාවෙන් දුන් අදහසක් මහෞෂධ පඬිතුමා හස්ත මුද්‍රාවෙන් දුන් අදහස් අනුව ඔවුනොවුනට එය වටහාගත හැකි විය.[3]

මේ අනුව බැලීමේ දී ප්‍රතිමා ශිල්ප ශාස්ත්‍රයට අනුව මුද්‍රා හුදෙක් ඇඟිලිවලින් මෙන් ම අතට ගත් ආයුධ හෝ වෙනත් උපකරණයන්ගෙන් ද නිරූපණය කෙරේ.

මෙහි දී ප්‍රතිමා ශිල්පියාගේ නිර්මාණ ක්‍රියාවලියට ඉමහත් පිටුවහලක් ලැබේ. බුදු සමයෙහි ප්‍රධාන ශාඛා දෙකවන හිනයාන මහායාන ප්‍රතිමාවලින් ද හින්දු දේව ප්‍රතිමාවලින් ද යම් යම් මුද්‍රා විශේෂයන් දැකගත හැකිය. දේව ප්‍රතිමාවල මුද්‍රාවන්හි විශේෂ අමුත්තක් පෙනේ. එනම් **"සංඛ, පද්ම, කෝමර, හදාදාධාදී"** යම්කිසි වස්තුවක් අතින් ගෙන නිරූපණය කිරීමයි. එහෙත් බුද්ධ ප්‍රතිමාවල එබඳු බාහිර උපකරණයක් දරණ ස්වරූපයක් නැත. දෙවියන්ගේ දේව බලය වඩ වඩා තීව්‍ර ලෙස දක්වීමේ ඕනෑකම් නිසා ඔවුන් අයත් මුද්‍රා සංඛාභාව ද වැඩි විය. මුද්‍රා එකුන් විස්සක් විෂ්ණුට අයත් සේ ද ගණේෂව හතක් අයත් සේ ද දක්වේ. අග්නිට ද හතක් වෙයි. බ්‍රහ්මට මුද්‍රා දෙකක් වන අතර සූර්යකට ඇත්තේ එකම මුද්‍රාවකි. එනම් පද්මයයි.

අදහස් ප්‍රකාශනයට වචන භාවිත නොවන කල්හි අංග චලනය ප්‍රකාශන මාධ්‍යයක් වශයෙන් ද මුද්‍රාව භාවිතයට ගනු ලැබිය. මුද්‍රා යන්න විවිධ අර්ථකතන රාශියක් හමුවන වචනාර්ථයක් වශයෙන් ද හැඳින්විය හැකිය. ක්‍රි.පූ. යුගයේ සිට වැදගත් ප්‍රතිමා ලක්ෂණයක් සේ මුද්‍රා ලක්ෂණ ප්‍රතිමාවලට ආරෝපණය වූයේ පුදපූජාවල දී උපයෝගී කරගත් ගුප්ත ඉරියව්වල විකාශනය තුළින් ය. උම්මග්ග ජාතකයේ සඳහන් වන පරිදි මහෞෂධ පඬිවරයා හා අමරා දේවිය සල්ලාපයේ යෙදුණේ හස්ත මුද්‍රාවෙනි. මූර්ති කලාව හෝ ප්‍රතිමා ශාස්ත්‍රයේ දී කුමන හෝ ආගමික සිද්ධියක් සංකේතාත්මකව දක්වීම පිණිස නැතහොත් විවිධ ශාස්තෘවරුන්, දෙවි දේවතාවන් හෝ බෝසත්වරුන් එකිනෙකාගෙන් හෝ එකිනෙක ස්වරූපයෙන් වෙන්කර හඳුනා ගැනීම පිණිස අත්වලින් නිරූපණය කරන විශේෂ ස්වරූපය මුද්‍රා නමින් හැඳින්විය හැකිය.[4] මෙලෙස බැලීමේ දී සම්මත හස්ත මුද්‍රාමය භාෂාවන් මුද්‍රා නමින් හැඳින්වෙන බව කුමාරස්වාමීගේ ද අදහස වී ඇත. ප්‍රතිමා ශිල්ප ශාස්ත්‍රයට අනුව මුද්‍රා හුදෙක් ඇඟිලිවලින් මෙන් ම අතට ගත් ආයුධ හෝ වෙනත් උපකරණයන්ගෙන් ද නිරූපණය කෙරේ. බුදු පිළිමවල මුද්‍රා සහ වෙනත් බාහිර සංකේත සම්බන්ධ වී ඇත. මුද්‍රාවල දී මූලිකත්වය ලැබෙන්නේ අත් සහ ඇඟිලිවලින් දක්වෙන අභිනයන්ට නිසා ශිල්ප ශාස්ත්‍රවේදී මුද්‍රා වෙනුවට **"හස්ත"** යන වචනය ද භාවිත වී ඇත. හින්දු ප්‍රතිමා ශිල්පය තුළ මුද්‍රා හැට හතරක් දක්නට ලැබෙන අතර බුද්ධ ප්‍රතිමාවල දී භාවිත කර ඇත්තේ මින් ඉතා සීමිත ප්‍රමාණයකි. බුද්ධ ප්‍රතිමාවන් නිරූපණය කෙරෙන බුද්ධ ප්‍රතිමාවක මුද්‍රා යොදන්නේ බුදුන් වහන්සේගේ සීලය, සමාධිය, කරුණාව ආදී ආධ්‍යාත්මික, උත්තරීතර ගුණයන් කායික අංග ප්‍රත්‍යාංගවල යම්කිසි සටහනක් තුළින් දැන්වීම සඳහා ය. මුද්‍රාවල දී මූලිකත්වය ලැබෙන්නේ


[2] බුදු පිළිම මුද්‍රා සහ ආසන, 30 පිටුව
[3] උම්මග්ග ජාතකය, 1978: 43 පිටුව
[4] ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා ලක්ෂණ, 142 පිටුව

අත් සහ ඇඟිලිවලින් දක්වෙන අභිනයන්ට නිසා ශිල්ප ශාස්ත්‍රයෙහි දී මුද්‍රා වෙනුවට **"හස්ත"** යන වචනය ද භාවිත වී ඇත. "**අභය හස්ත, ගජ හස්ත, ලෝලහස්ත**" ආදී වශයෙනි.[5] විචාරකයන්ගේ පිළිගැනීම අනුව මුද්‍රා දහතුනක් ද සම්මතයෙහි දහයක් ද ඇත.

| | | | |
|---|---|---|---|
| **1.** | **අභය මුද්‍රාව** | **8.** | **විතර්ක හස්ත මුද්‍රාව** |
| **2.** | **ධ්‍යාන මුද්‍රාව** | **9.** | **කටක හස්ත මුද්‍රාව** |
| **3.** | **වරද මුද්‍රාව** | **10.** | **කර්තරි හස්ත මුද්‍රාව** |
| **4.** | **ධර්මචක්‍ර මුද්‍රාව** | **11.** | **ගජ හස්ත මුද්‍රාව** |
| **5.** | **ශුචි හස්ත මුද්‍රාව** | **12.** | **කටක විලම්බිත හස්ත මුද්‍රාව** |
| **6.** | **අඤ්ජලි හස්ත මුද්‍රාව** | **13.** | **ලෝලහස්ත මුද්‍රාව** |

**1. සමාධි මුද්‍රාව**

බුදුවරයෙකු ලබන සර්වඥතා ඥානය ප්‍රඥාවේ දියුණුම අවස්ථාව වේ. මේ අනුව සලකන විට සමාධිය බුද්ධ ප්‍රතිමාවක විශේෂ ලක්ෂණයකි. වීරාසනයෙන් අසුන් ගත් ප්‍රතිමාවේ සන්සුන් ඉරියව්වෙන් යුතුව අත්ල පිට අත්ල පිහිටිය යුතුය. සමාධි මුද්‍රාව හෙවත් ධ්‍යාන මුද්‍රාව නිරූපණය වන්නේ අත්ල උඩුකුරුව සිටින සේ වම් අත්ල මත දකුණු අත්ල පිහිටන ආකාරයෙන් දැත උකුලේ තැබීමෙනි. සමාධි ඉරියව් ස්වාභාවය නම් **ඍජු ශරීරයක්, පර්යංකාසනයක්, දෑත උකුල මත තිබීමත්, අඩවන් දෙනෙත්, බැල්ම හාසිකාග්‍රය, විළුඹ හා මහපටැඟිල්ල** යන ස්ථානවලට නෙළීමක් සහ බාහිර ලක්ෂණවලින් යුක්ත වීමයි. නිවන කෙළවර කොටගත් ශාරීරික හා මානසික ඒකමිතිය උපදවන සමාධිය සමාධි මුද්‍රාවේ සංකේතය වන බව ර්ටල්ගේ පිළිගැනීමයි. අනුරපුර සමයෙහි විසූ කලාකරුවෝ හිඳි පිළිමවල මෙම මුද්‍රා ලක්ෂණය ධ්වනිත කිරීමට විශේෂ ලැදියාවක් දැක්වුවෝය. මෙය බහුල වශයෙන් නිරූපණය වන්නේ පද්මාසනය හෝ වීරාසනය සහිත ප්‍රතිමාවලය. බුදුරජාණන් වහන්සේ සමාපත්ති සුවයෙන් වැඩ සිටීම තුළින් ප්‍රකට කෙරෙන්නේ උන්වහන්සේගේ නික්ලේශී බව, වීරාගී බව, මහා කරුණාව, මහා ප්‍රඥාව ආදී අතිවිශිෂ්ට ගුණාංගයන්ය.[6]



**ඡායාරූපය 01: අනුරාධපුර සමාධි බුද්ධ ප්‍රතිමාවෙහි සමාධි මුද්‍රාව**

ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ සමාධි මුද්‍රාවල නිරූපිතව තිබුණු අතර ක්‍රි.පූ. 02 - 03 වැනි ශතවර්ෂවලට අයත් උජ්ජේනි තඹ කාසියක ඇති පද්ම පීඨය සහිත දේව රූපය ධ්‍යාන මුද්‍රාවට ආසන්න ස්වරූපයකින් දැත නිරූපනය කර ඇත.[7] ඉන්දියාවේ ද ලංකාවේ ද ධ්‍යාන මුද්‍රාව එකම ස්වරූපයෙන් යුක්ත වේ. බෞද්ධ සාහිත්‍යගත තොරතුරු අනුව බෝධි වෘක්ෂ කුලයේ දී බුදුන් සමාධියට පත් වූ අවස්ථාව මෙයින් නිරූපණය වන බව දැක්විය හැකිය. ලංකාවේ සමාධි බුද්ධ ප්‍රතිමාවන්ට විශේෂ ස්ථානයක් ලැබීමට අවශ්‍ය පසුබිමක් ද ඇත්තේය. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ගමනේ දී උන්වහන්සේ මහියංගනයේ අහසෙහි වැඩහුන්නේ පළක් බැඳ ගෙන සමාධිගතවය. දෙවනවර මිණි පළඟ පරිභෝග කළේ සමාධි සුවයෙන් හිඳිමිනි. තෙවන ගමන දීඝවාපිය වැනි සිද්ධස්ථාන පරිභෝග කළේ ඒ ඒ ස්ථානයන් හි සමාධි සුවයෙන් කල් ගෙවමිනි. මේ නිසා සිංහල බෞද්ධයා තුළ සමාධි බුද්ධ රූපය ගැන පූර්ව සංකල්පයන් පහළව තිබුණේය. මෙලෙස බැලීමේ දී බුදුරදුන්ගේ අධ්‍යාත්මික ගුණයන් මතුකර දැක්වීමට වඩාත් සුදුසු ඉරියව්ව ද සමාධිගත ස්වරූපය ලෙස හැඳින්විය හැකිය.

ලාංකේය බුද්ධ ප්‍රතිමා පිළිබඳ සලකා බලනවිට සමාධි මුද්‍රාව මෙරට බෙහෙවින්ම ජනප්‍රිය වූ මුද්‍රාව වශයෙන් සඳහන් කළ හැකිය.[8] පසුකාලීනව අනුරාධපුර, පොළොන්නරුව, යුගවලට අයත් සියලුම හිඳි පිළිම බුදුන් වහන්සේගේ අධ්‍යාත්මික ගුණ මූර්තිමත් කෙරෙන සමාජ යුධමය බුදු පිළිමයන්ය. තොලුවිල

[5] බුදු පිළිම මුද්‍රා සහ ආසන, 28 පිටුව
[6] බුදු පිළිම මුද්‍රා සහ ආසන, 28 පිටුව
[7] ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා ලක්ෂණ, 1999: 147 පිටුව
[8] බුදු පිළිම මුද්‍රා සහ ආසන, 30 පිටුව

මහමෙව්නාව, මැදිරිගිරිය, කොළඹ කෞතුකාගාරය, ගල්අමුණ හා උවර්සන්කුලම යනා දී ස්ථානවල සෙල් පිළිම ධ්‍යාන මුද්‍රාව සහිත ඉතා උසස් ප්‍රතිමා ලෙස හැඳින්විය හැකිය.

## 2. ධර්මචක්‍ර මුද්‍රාව

බුද්ධ ප්‍රතිමාවන් හි දක්නට ඇති මුද්‍රා අතර ධර්මචක්‍ර නමින් හැඳින්වෙන මුද්‍රාව බුදුන් වහන්සේගේ ධර්ම දේශනා විලාසය සංකේතවත් කරන්නකි. ධර්මචක්‍ර මුද්‍රාව හඳුනාගත හැකි ප්‍රධාන ලක්‍ෂණය නම් දකුණු අත්ල පිටතට හරවා පපුවේ මට්ටමට තබා ගෙන එහි දබර ඇඟිල්ලේ හා මාපට ඇඟිල්ලේ තුඩු දෙක කවයක් සෑදෙන සේ එකට තබා ඇතුළට හැරුණු වම් අතේ ඇඟිල්ලක් ස්පර්ශ කරන අයුරින් පැවතීමය. බෞද්ධාගමේ ධර්මචක්‍රය පිළිබඳ අදහස වෛදික සූර්යය වන්දනාව පිළිබඳ අදහස් පදනම් කරගෙන ප්‍රභවය වූවක් ලෙස ද සඳහන් වේ. බොහෝවිට ධර්මචක්‍රයෙන් අනන්ත වූ සංසාර වෘක්‍ෂය ධ්වනිත වන බව සිතිය හැකිය. බුද්ධ ප්‍රතිමා ආරම්භයේ දී බුද්ධ චරිතයේ වැදගත් අවස්ථාවක් සඳහා පමණක් ධර්මචක්‍රය යොදා ගන්නා ලදි. බුදුන් වහන්සේ ඉසිපතනයේ දී අනුත්තර වූ ධර්මචක්‍රය පැවැත්විය. " **ඉසිපතනෙ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං"**[9] යනුවෙන් මෙය දැක්විය හැකිය.

ශාක්‍යසිංහයන් වහන්සේ දහම්සක මුළු ලොව පෙරලන්නාහ. ධර්මචක්‍ර මුද්‍රාව බුද්ධ ප්‍රතිමාවලට පමණක් සීමාවූවක් බව පැහැදිලි වේ. බුද්ධ ප්‍රතිමාවල දක්නට ඇති මුද්‍රාවන්ගෙන් නිරූපණය වන සංකේතාර්ථ රාශියකි. ප්‍රතිමා කලාවෙහි ලක්‍ෂණ මෙන් ම බුද්ධ චරිතය හා බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ උගතුන් විසින් විවිධ අර්ථ කථන ඉදිරිපත් කොට ඇත. ධර්මචක්‍ර මුද්‍රාව හරිහැටි සකසා තිබෙන්නේ ගුප්ත යුගයේ සිට ය. ක්‍රි.පූ. 02වන සියවසට අයත් කැටයමක දැක්වෙන බව ද එය වැඩිදුරටත් සඳහන් වේ. මහායානිකයන් අතර ද ජනප්‍රියත්වයට පත් මෙම මුද්‍රාව මෛත්‍රය බෝධිසත්ත්වයන්ගේ මුද්‍රා තැනින් එකකි. එසේම ප්‍රඥා පාරමිතා දෙවගනගේ මුද්‍රා ලක්‍ෂණය ද වෙයි. බුදුන් වහන්සේ ප්‍රථම වරට පස්වග තවුසන් උදෙසා දේශනා කළ ධර්මයට **"ධම්මචක්ක සූත්‍රය"**[10] යන නම ව්‍යවහාර වී ඇත්තේ ද ක්‍රි.ව. 05 - 06 ශතවර්ෂවල දී තනන ලද බුද්ධ ප්‍රතිමාවක චක්‍රයක ආකාරයෙන් අත්වල ඇඟිලි පිහිටුවා තිබීමෙන් සංකේතවත් කෙරෙන්නේ **"ධම්ම චක්ක සූත්‍ර"**[11] දේශනාව බව පැහැදිලිව සිතාගත හැකිය. යුක්තිය පසිඳලීමේ මුද්‍රාව සහිත සමහර භාරතීය දක්‍ෂිණ මූර්ති, ශිව ප්‍රතිමා බොහෝදුරට ධර්මචක්‍ර මුද්‍රාවට සමාන වනු ඇත. ලාංකේය ප්‍රතිමා කලාව දෙස බැලීමේ දී අම්බලන්තොටින් සොයාගත් ප්‍රලම්භපාදාසනය සහිත ප්‍රතිමාවේ ධර්මචක්‍ර මුද්‍රාව තිබෙන නමුත් එය දේශීය නිර්මාණයක් නොවන බව ද බොහෝදුරට ගැටළුවක්ව පවතිනු ඇත. ගෞතම හෙවත් ශාක්‍යමුනි බුදුන් හැරුණු විට මෙම මුද්‍රාව සහිත ප්‍රතිමා හමුවන්නේ මෛත්‍රී හෙවත් මිරෝකු බෝධිසත්ත්ව ප්‍රතිමාවල පමණි. මෙලෙස බැලීමේ දී පැහැදිලි වනුයේ ධර්මචක්‍ර මුද්‍රාව වශයෙන් හඳුන්වනු ලබන්නේ බුදුන් වහන්සේ ධර්ම දේශනා කරන ආකාරය පැහැදිලි කිරීම් ය. ධර්මචක්‍ර මුද්‍රාව සහිත බුද්ධ ප්‍රතිමා හෝ බෝධිසත්ත්ව ප්‍රතිමා හෝලංකාවේ දක්නට නොලැබෙන බව කිව යුතුය.

## 3. අභය මුද්‍රාව

බුද්ධ ප්‍රතිමා තැනීමේ ආරම්භක අවස්ථාවේ පටන් ම දක්නට ලැබෙන මුද්‍රාවක් වශයෙන් අභය මුද්‍රාව හැඳින්විය හැකිය. ලංකාවේ ප්‍රතිමාවල සුලබව දක්නට ලැබෙන ලක්‍ෂණයකි. මෙම ලක්‍ෂණය පිහිටන්නේ දකුණත වැලමිට ළඟින් නමා උඩට ඔසවා ඉදිරියට පාන ලද අල්ල දැක්වීමෙනි. අභය මුද්‍රාවෙන් යුක්ත ලංකා ප්‍රතිමාවල වමත ද වැලමිට ළඟින් ඔසවා පිටුපසට හරවා නවා ගත් ආකාරය හැම එකකම මෙන් දැනගත හැකිය. දකුණත අභය මුද්‍රා ලක්‍ෂණයෙනුත්, වමත උකුල මත රැඳී ඇති ආකාරයෙනුත් නිරූපණය කිරීම මථුරා බුද්ධ ප්‍රතිමාවලට අයත් සාම්ප්‍රදායික ලක්‍ෂණයකි. මෙම මුද්‍රා ලක්‍ෂණය අර්ථ දෙකක් දෙන්නට භාවිත කොට ඇති බව කිව හැකිය. බුදුන් වහන්සේ තුළ තිබුණේ නිර්භීතභාවය හා අභය දානයක් ය. අවුකන බුද්ධ ප්‍රතිමාවෙහි දක්නට ඇති මෙම ලක්‍ෂණය ආශීෂ මුද්‍රාව[12] වශයෙන් ද හඳුන්වනු ලැබේ. අභය මුද්‍රාව බොහෝ සංකේතාර්ථ බහුල මුද්‍රාවකි.

---

[9] ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා ලක්‍ෂණ, 147 පිටුව

[10] බුදු පිළිම මුද්‍රා සහ ආසන, 33 පිටුව

[11] බුදු පිළිම මුද්‍රා සහ ආසන, 33 පිටුව


[12] බුදු පිළිම, 12 පිටුව

නාට්‍ය ශිල්පයේ පතාක හස්තයෙන් නිරූපිත බිය දුරුකිරීම, වියවුලන් සංසිඳවීම, සභාවක් ඇමතීම, දිවුරුම් දීම හා ආශිර්වාද කිරීම යන අදහස් අභය මුද්‍රාව මගින් ඉදිරිපත් කරයි. ප්‍රතිමා ශාස්ත්‍රයෙහි විශ්ව ලාංඡනයක් වූ අභය මුද්‍රාව හින්දු දේව ප්‍රතිමා, ජෛන තීර්ථංකර ප්‍රතිමා, මෙන් ම මහායාන බෝධිසත්ත්ව ප්‍රතිමාවල ද හිටි පිළිම හා හිඳි පිළිමවල ද විශේෂත්වයක් නැතිව දක්නට ලැබේ.[13] ගාන්ධාර බෞද්ධ ප්‍රතිමා කලාවේ ප්‍රභවයේ සිට අභය මුද්‍රාව ක්‍රමයෙන් විකාශනය වී ඇත. මෙහි හස්තය උරහිස මට්ටම දක්වා උස් වූ ස්වාභාවයන් ගනු ඇත. බෞද්ධ සාහිත්‍යගත කරුණු අනුව නාලාගිරි ඇතු දමනය කිරීම සඳහා බුදුන් වහන්සේ දකුණු අත්ල එසවීම අභය මුද්‍රාවේ ප්‍රභවයක් වශයෙන් දැක්වීමට පිළිවෙන. අභය මුද්‍රාවෙන් මූර්තිමත් කරන සංකේතාර්ථය නම් නිර්භීතභාවයයි.[14] අභය මුද්‍රා බුදුපිළිම වලින් නිරූපණය කෙරෙන්නේ බුදුරජාණන් වහන්සේ සියලු සත්ත්වයාට මෛත්‍රී පූර්වකව ආශිර්වාද කිරීම යනු සාම්ප්‍රදායික මතයයි.




**ඡායාරූපය 02 - රංගිරි දඹුලු විහාරයේ පිහිටි ධර්මචක්‍ර මුද්‍රාව සහිත බුද්ධ ප්‍රතිමාව**

දකුණු හස්තය අභය මුද්‍රාවෙන් තිබීමත්, වමතින් චීවරය දරා සිටීමත් දීපංකර බුදුන්ගේ ලක්‍ෂණයක් ලෙස දැක්විය හැකිය. ශිව වැනි දෙවිවරුන්ගේ ප්‍රතිමාවල ගැලවුම්කරුවා යන අදහසින් අභය මුද්‍රාව යෙදෙන බව කිව හැකිය. ලාංකේය ශිල්පීන් අතර ජනප්‍රිය මුද්‍රාවක් වශයෙන් අභය මුද්‍රාව දැක්විය හැකිය. ලංකාවේ ශෛල ප්‍රතිමා තුළින් මෙම මුද්‍රාව පිළිබිඹු වන අතර අවුකන පිළිමයේ දකුණු අත්ල වම්පසට යොමු වී ඇති අතර රුවන්වැලි සෑ විහාර ප්‍රතිමාවේ සම්පූර්ණයෙන් ම වම්පසට කොටු වී ඇත. අභය මුද්‍රාවන්හි වමත ද වැලමිට ළඟින් ඔසවා පසුපසට හරවා තබාගෙන සිටීම ද අනිවාර්යය ලක්‍ෂණයන් බවට පත්ව



ඇත. ගඩලාදෙණිය හා කොළඹ කෞතුකාගාරයේ දක්නට ලැබෙන බුද්ධ ප්‍රතිමා රසකි. ඉදිරියට වූ අත්ල ඇති නමුත් ඒ දෙකම විදේශීය ලෝහ පිළිම වශයෙන් පිළිගැනේ. ලංකාවේ විශාල ප්‍රමාණයේ අභය මුද්‍රා පිළිම අතර මහඉලුප්පල්ලම හිටි පිළිමය, සැස්සේරු හිටි පිළිමය, වෙහෙරගල හිටි පිළිමය, බුදුරුවගල හිටි පිළිමය විශේෂයෙන් සඳහන් කළ යුතුය. මෙලෙස බැලීමේ දී අභය මුද්‍රාව සහිත දකුණු අත්ල වමට යොමු කිරීම මෙරට ප්‍රතිමාවල විශේෂ ලක්‍ෂණයන් බව පැහැදිලි වේ. අභය මුද්‍රාව සහිත අත්ල වම් පසට යොමු කර දැක්වීම දේශීය කලාකරුවන්ගේ දක්‍ෂ, ස්වයං නිර්මාණයක් ලෙස හැඳින්විය හැකිය.

**ඡායාරූපය 03: අභය මුද්‍රාව**

[13] බුදු පිළිම මුද්‍රා සහ ආසන, 36 පිටුව

[14] බුදු පිළිම මුද්‍රා සහ ආසන, 36 පිටුව

**4. විතර්ක මුද්‍රාව**

බුද්ධ ප්‍රතිමාවන් හි දක්නට ලැබෙන තවත් ජනප්‍රිය මුද්‍රාවක් වශයෙන් විතර්ක මුද්‍රා ශෛලීය හැඳින්විය හැකිය. මෙම මුද්‍රාව බුදුරජාණන් වහන්සේ යම්කිසි ගැටලුවක් නිරාකරණය කරන ආකාරයෙන් දැඩි වෙන්නකි. මෙහි දී දකුණත, මාපටගිල්ල හා දබරගිල්ල එක්කොට ගෙන පිහිටුවා ගත් ආකාරයෙන් දක්වෙයි. ගැටලු විසඳීම හෝ ධර්මය පැහැදිලි කර දීම සඳහා යෙදෙන විතර්ක මුද්‍රාව මාපටැගිල්ල දබර ඇඟිල්ල ස්පර්ශ වීමෙන් සෑදුණු කවයක් සහිතව දිගු කරන ලද සෙසු ඇඟිලි සහිත අත්ල ඉදිරියට යොමු කර නිරූපණය වන **"චින් මුද්‍රාව"** හෙවත් **"ව්‍යඛ්‍යාන මුද්‍රාව"** ලෙස රාබි හඳුන්වන මුද්‍රාවට සමාන ය.[15] විතර්ක මුද්‍රාව ඥාන මුද්‍රාවේ ප්‍රතිවිරුද්ධ මුද්‍රාව වන අතර දකුණු අත්ල පිටතට යොමුව තිබේ. ලංකාවේ බෞද්ධ ප්‍රතිමා කලාවේ ද අල්ප වශයෙන් විතර්ක මුද්‍රාව යොදාගෙන ඇත. මෙය බහුල වශයෙන් ම දැකිය හැක්කේ හිටි පිළිම වලයි. විශේෂයෙන් ම මහනුවර යුගයේ පිළිමවල සුලබව පෙනෙන්නකි. මහායාන ප්‍රතිමාවල මෙන් ම හීනයාන ප්‍රතිමාවල ද බහුල වශයෙන් දක්නට ලැබෙන විතර්ක මුද්‍රාව ද මෙයයි. බෞද්ධ ප්‍රතිමා කලාවෙහි විතර්ක මුද්‍රාව දක්වෙන පැරණිම නිදර්ශනයක් වශයෙන් හමුවන්නේ තක්ෂිලා කෞතුකාගාරයේ තබා ඇති ධර්මරාජිත නම් ස්ථානයෙන් සොයාගත් ගෞතම බෝධිසත්ත්ව ප්‍රතිමාවයි.[16] විතර්ක මුද්‍රාව හිඳි පිළිම මෙන් ම හිටි පිළිමවල ද විශේෂයක් නැතිව දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ මෙම මුද්‍රාව සහිත බුදු පිළිමයක් පළමුවෙන් හමුවන්නේ දැනට කොළඹ ජාතික කෞතුකාගාරයේ තබා ඇති ක්‍රි.ව. 05 - 06 ශත වර්ෂවලට අයත් යැයි සැලකෙන බදුලු දිස්ත්‍රික්කයෙන් හමු වී ඇති හිඳි පිළිමයයි.



**ඡායාරූපය 04: විතර්ක මුද්‍රාව**

විතර්ක මුද්‍රාව බුද්ධ ප්‍රතිමා කලාවට සම්බන්ධ වී ඇත්තේ ශාස්තෲන් වහන්සේගේ ධර්ම දේශනා විලාසයක් වශයෙනි. විතර්ක යන වචනයේ තේරුම කිසියම් කරුණක් පිළිබඳ ගැඹුරින් චින්තනය යොමු කිරීමයි. වාද විවාද කිරීම ද විතර්ක යන වචනය හා සම්බන්ධ වෙයි. මෙලෙස බැලීමේ දී අභය මුද්‍රාව සහිත දකුණු අත්ල වමට යොමු කිරීම මෙරට ප්‍රතිමාවල විශේෂ ලක්ෂණයක් බව පැහැදිලි වේ. මෙම මුද්‍රාව දේශීය කලාකරුවන්ගේ දක්ෂ ස්වයං නිර්මාණයක් ලෙස හැඳින්විය හැකිය.

**5. භූමි ස්පර්ශ මුද්‍රාව**

බුද්ධ ප්‍රතිමාවන්හි දක්නට ලැබෙන තවත් ප්‍රධාන මුද්‍රාවකි. බෝසතාණන් වහන්සේ බුදු බව ලබන අවස්ථාවේ කළ මාර පරාජය පිළිබිඹු කෙරෙන්නක් වන මෙයින් එම අවස්ථාවේ උන්වහන්සේ මිහිකත මට සාක්ෂිය යැයි පොළොවට අත දිගු කළ ආකාරය දක්වේ. වචනාර්ථයට අනුව එහි අදහස භූමිය හෙවත් පොළොව ස්පර්ශ කිරීම යනු ය. වැඩි වශයෙන් ම පද්මාසනාරූඪව වැඩසිටි ආකාරයෙන් නිර්මාණය වී ඇත්තේ දක්ෂිණ හස්තය දක්වෙන ස්වරූපයෙහි ය. දකුණු අත, දකුණු දණහිස උඩින් අත්ල ඇතුළට සිටින ආකාරයෙන් සියලු ඇඟිලි දිගහැර පහතට යොමුව තිබීමයි. වම් අත දිගහැර හා ඒ මත පිහිටුවා ගන්නා ආකාරයෙනුත් දක්වෙයි. හම්මාචාර්යය පවසන පරිදි භූමි ස්පර්ශ මුද්‍රාවෙන් යුක්ත දෙවියන් හෝ ශාස්තෲවරයන් පද්මාසනයෙන් හෝ වජ්‍රාසනයෙන් සිටිය යුතුය. බුද්ධ ප්‍රතිමා අතර වුව ද හිඳි පිළිම සඳහා පමණක් මෙම මුද්‍රාව සීමාවෙයි.

භූමි ස්පර්ශ මුද්‍රාව ලංකාවේ ප්‍රතිමා සඳහා භාවිත කොට ඇත්තේ ඉතාමත් සුළු වශයෙනි. බුද්ධ ප්‍රතිමාවන් හි නිරූපණය වන මුද්‍රාවන්ගේ සංකේතාර්ථ පැහැදිලි කරන උගතුන් විසින් බුදුන් වහන්සේගේ ජීවමාන චරිතයෙහි විවිධ අවස්ථාවන් හා ධර්මයේ විවිධ ඉගැන්වීම් එයට සම්බන්ධව ඇත. භූමි ස්පර්ශ මුද්‍රාවට මූලික වී ඇත්තේ මහාවස්තු, ලලිත විස්තර ආදී ග්‍රන්ථවල එන මිහිකත සාක්ෂි කොටගත් කතාව වුවද කෙලෙස් සතුරන් මැඩපැවැත්වීමේ ශක්තිය, වෙසතුරු, අත්බැම් දක්වා සම්පූර්ණ කළ දාන පාරමිතාවේ බලය ඉන් කිහිපයකි. අනෙකුත් මුද්‍රා අතර භූමි ස්පර්ශ මුද්‍රාව, ගෞතම බුද්ධ ප්‍රතිමාවලට සුවිශේෂී වූවක් ලෙස සැලකිය හැකිය.

ඒ අනුව භූමි ස්පර්ශ මුද්‍රාවේ ස්වරූපය ගැන ප්‍රථම වරට හමුවන්නේ මහාවස්තු නම් අමදාන ග්‍රන්ථයේ ය. ඔස්වල්ඩ් සිරේන් නම් අංශ ලේඛකයා දක්වන පරිදි අනෙකුත් මුද්‍රා අතර භූමි ස්පර්ශ මුද්‍රාව ගෞතම බෞද්ධ ප්‍රතිමාවලට සුවිශේෂී වූවක් ලෙස සැලකිය හැකිය. මහියංගනය ස්තූපයේ කුඩා සෙල්

---

[15] ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා ලක්ෂණ, 150 පිටුව

[16] බුදු පිළිම මුද්‍රා සහ ආසන, 38 පිටුව

පුවරුවකත්, සේරුවාවිල කුඩා පරිමාණ හා තවත් ලෝහ ප්‍රතිමාවක් ද භූමි ස්පර්ශ මුද්‍රාවෙන් නිරූපණය වෙයි.

ගාන්ධාර ශෛලියට අනුව ඉන්දියාවේ නිමැවුණු ප්‍රතිමා අතර කලාතුරකින් භූමි ස්පර්ශ මුද්‍රා දක්නට ලැබුණ ද, වැඩි වශයෙන් ප්‍රචලිත වූයේ ක්‍රි.ව. 04වන ශත වර්ෂයෙන් පමණ පසුව ය. දකුණු ඉන්දියාවේ ඇති බොහෝ ප්‍රතිමාවල මෙම ලක්ෂණ දක්නට ඇත. ථේරවාද රටවල ද මෙම මුද්‍රාව සහිතව නිර්මාණය කළ බුද්ධ ප්‍රතිමා ප්‍රධාන විහාරස්ථාන සෑම එකකම බහුලව දක්නට ලැබෙනු ඇත.





**ඡායාරූපය 05: අනුරාධපුර රුවන්වැලි මහා සෑයෙහි පිහිටි භූමි ස්පර්ශ මුද්‍රාව සහිත බුද්ධ ප්‍රතිමාව**

## 6. වරද මුද්‍රාව

බුද්ධ ප්‍රතිමාවල දක්නට ලැබෙන හස්ත මුද්‍රා අතර බොහෝ රටවල ප්‍රචලිත වූ මුද්‍රාවකි. හීනයාන, මහායාන යන බෞද්ධ ශාඛා දෙකේ ම ප්‍රතිමාවල පෙනෙන මේ මුද්‍රා ලක්ෂණය **"වර මුද්‍රාව"** හැටියටත් ප්‍රකටය. වරද මුද්‍රාව නමින් හැඳින්වෙන්නේ දකුණත පහත්කොට ඉදිරියට දිගහැර අත්ල උඩු අතට හරවා ඇඟිලි දිග හැර තිබීමය. වරද මුද්‍රාව බුදු පිළිමයට හෝ බෞද්ධ කලාවට හෝ පමණක් ආවේණික ලක්ෂණයක් නොවේ. මෙම මුද්‍රා ලක්ෂණය ක්‍රි.ව. 04වන ශතවර්ෂයේ පමණ ආරම්භ වන්නට ඇතැයි පුරාවිද්‍යාඥයන්ගේ පිළිගැනීමයි. බෞද්ධයන් අතර **"වරදාන"** හා **"දාන"** නම්වලින් ද හැඳින්වේ. මහායාන බෞද්ධ මුද්‍රා ගැන සඳහන් වන ජපන් ග්‍රන්ථවල එය හඳුන්වන්නේ **"සේයාහින්"** යනුවෙනි. එයින් ගම්‍යමාන වන්නේ යමක් පිරිනැමීම පෙන්වන සංඥාව යන්නයි.[17] වරද මුද්‍රාව, බුද්ධ ප්‍රතිමා අතර බෙහෙවින් දක්නට ලැබෙන්නේ හිටි පිළිමවලය. ඉන්දියාවේ අජන්තා ගල්ලෙන් විහාරයේ හා නේපාලයේ **"ස්වසමභූනාතිහි"** මෙම මුද්‍රාවෙන් නිරූපිත පැරණි ප්‍රතිමා දෙකක් දක්නට ලැබේ. වරද මුද්‍රාව දකුණු අතින් පිළිබිඹු කරන්නක් වුවද සමහර බුද්ධ ප්‍රතිමාවෙහි වම් අතෙහි මෙම ලක්ෂණය දක්නට ලැබේ.

[17] බුදු පිළිම මුද්‍රා සහ ආසන, 44 පිටුව

ආරම්භයේ දී මෙම මුද්‍රාව හිටි පිළිමවලට සීමා වූවත් පසුකාලීනව වැඩහිඳින පිළිම මෙන් ම බෝධිසත්ත්ව ප්‍රතිමාවල ද නිරූපණය කෙරිණි. ලංකාවේ නිර්මාණය කරන ලද බුද්ධ ප්‍රතිමාවල වරද මුද්‍රාව දක්නට නොලැබුණ ද දූනට ගඩලාදෙණිය විහාරයේ ඇති ලෝකඩ බුද්ධ ප්‍රතිමාවේ වම් අත දක්වෙන්නේ වරද මුද්‍රාවෙනි. මෙහි වරද මුද්‍රාවේ අර්ථ විග්‍රහයන් බොහෝමයක් පවතිනු ලැබේ. පාලි හා සංස්කෘත යන භාෂා දෙකෙහි ම සමානව යෙදෙන **"වර"** යන්නෙහි අර්ථ කිහිපයක්ම ඇත. **"උතුම්, ශ්‍රේෂ්ඨ, පොරොන්දුව, ප්‍රාර්ථනය"** යන්නය. **"වරදානය"** යන අදහස බෞද්ධ ඉගැන්වීම්වල දක්නට ලැබෙන්නේ මහායාන සම්ප්‍රදාය තුළයි. වරද මුද්‍රාවෙන් දක්වෙන සංකේතාර්ථය පිළිබඳ තවත් මතයක් නම් එය බුදුන් වහන්සේගේ මහා කරුණා ගුණය මූර්තිමත් කිරීමක් බවය. බුදුරාජාණන් වහන්සේගේ පරිත්‍යාගශීලී ගුණය හෙයින් දානය යනුවෙන් ද දක්විය හැකිය. මෙමගින් බොහෝදුරට සංකේතාර්ථය පිළිබිඹු වනුයේ බුදුන් වහන්සේගේ මහා කරුණා ගුණය මූර්තිමත් කිරීමක් බවයි.



ඒ අනුව ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමා කලාවෙහි භාවිත කරනු ලබන හස්ත මුද්‍රාවන්හි ඓතිහාසික ස්වරූපය වර්තමානයේ ද එලෙසින්ම පවතින්නේ දැයි විමසා බැලීමේ දී, අපට සමස්තයක් වශයෙන් හඳුනාගත හැක්කේ විවිධ වෙනස්කම්වලට ලක්වෙමින් වූවද ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමා කලාවෙහි භාවිත හස්ත මුද්‍රාවන් ඒ ඒ ශිල්පීන්ගේ හසුරු කුසලතාවය මත වර්තමානයේ ද තරමක් දුරට පවතින බවය.

**ඡායාරූපය 06: අනුරාධපුර ජේතවනාරාමයෙහි පිහිටි වරද මුද්‍රාව සහිත නටබුන් වූ බුද්ධ ප්‍රතිමාව**

## ග්‍රන්ථ නාමාවලිය


*බුද්ධ ප්‍රතිමා කලාව සහ බුදු පිළිමයේ විකාශනය,* 1995. විමලරතන හිමි, බෙල්ලන්විල, ශ්‍රීදේවි මුද්‍රණාලය.

*බුදු පිළිම*, ගොඩකුඹුරේ, චාල්ස්, කොළඹ 07: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

*බුදු පිළිමය මුද්‍රා සහ ආසන,* 1999. විමලරතන හිමි, බෙල්ලන්විල, සිස්ටමැටික් ප්‍රින්ට්, පුද්ගලික සමාගම.

*ශ්‍රී ලාංකික බුද්ධ ප්‍රතිමාව*, ධම්මදස්සී හිමි, දොඩම්කුඹුරේ.

*ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා කලාව,* 2006. වික්‍රමගමගේ, චන්ද්‍රා, කොළඹ 10: සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

*ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා ලක්ෂණශ* 1999. ලගමුව, ඒ, මධ්‍යම සංස්කෘතික අරමුදල, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.